# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No. }

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 29/03/21


පැමිණිලි පාර්ශවය : බී.එච්.එස් කුමාර මයා,
නො 52/1, හීන්පැන්දල පාර,
කෝවිල වත්ත,
ගාල්ල.

වගඋත්තර පාර්ශවය : විදුහල්පති,
රිච්මන්ඩ් විද්‍යාලය,
ගාල්ල.

<u>පැමිණිලි අංකය : **HRC/110/2020**</u>

ඉහත පැමිණිලිකරු විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින් සඳහන් කර ඇත්තේ, තම දෙවැනි දරුවා වන බී. නජනදීප් යන අය 2020 වර්ෂයේ ගාල්ල රිච්මන්ඩ් විද්‍යාලයේ පළමු ශ්‍රේණියට ඇතුළත් කරගැනීම සඳහා සහෝදර පදනම මත අයදුම් කර ඒ සඳහා පැවැති සම්මුඛ පරීක්ෂණය සඳහා අදාළ ලේඛන මුල් පිටපත්ද සහිතව ඉදිරිපත් කරන ලද බවයි. සම්මුඛ පරීක්ෂණයේදී තමාට ලකුණු 57.2 ක් ලබා දී ඇති බවත්, සහෝදර පදනමට ලැබිය යුතු කඩඉම් ලකුණු ප්‍රමාණය ලකුණු 47 ක් වන හෙයින් ඔහුට ඔහුගේ දරුවා පාසලට ඇතුළත් කිරිමට සියළු සුදුසුකම් තිබූ බවත්, කෙසේ වෙතත් පාසලේ විදුහල්පති සහ තවත් ගුරුවරයෙකු විසින් අවස්ථා 03 කදි ඔහුගේ පදිංචි ස්ථානය පරික්ෂා කිරීම සඳහා පැමිණි බවත්, එහිදී පදිංචිය සනාථ නොවූ බව පවසා ඔහුගේ අයදුම්පත සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කර දරුවාට පාසලට ඇතුළත් වීමට තිබූ අවස්ථාව අහිමි කළ බවත්ය.

ඒ අනුව තම දරුවා ඉහත කී වගඋත්තරකාර පාසලට ඇතුලත් කර දෙන ලෙසට මෙම පැමිණිල්ලෙන් ඉල්ලා ඇත.

මෙම පැමිණිල්ලට අදාළව සිදුකරන ලද පරීක්ෂණයේදී තවදුරටත් කරුණු ඉදිරිපත් කරමින් පැමිණිලිකරු සඳහන් කර ඇත්තේ, තම දරුවා වගඋත්තරකාර පාසලට ඇතුලත් කිරීම සඳහා අවශ්‍ය


| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office | 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04. | සභාපති / தவிசாளர் / Chairperson | 011-2505451 | ෆැක්ස් / தொலைநகல் / Fax | 011-2505541 / 74 | ඊමේල් / மின்னஞ்சல் / e-mail | sechrcsl@gmail.com |
| දුරකථන / தொலைபேசி / Telephone | 94 -11- 2505580 / 81 / 82 | ලේකම් / செயலாளர் / Secretary | 011-2505521 | ක්ෂණික / துரித அழைப்பு / Hotline | 1996 | වෙබ් / இணையம் / Web | www.hrcsl.lk |

සියලු සුදුසුකම් සපුරා තිබියදීත් වගඋත්තරකාර පාසලේ විදුහල්පති සහ තවත් ගුරුවරයෙකු විසින් ඔහු සහ බිරිඳ නිවසේ නොමැති අවස්ථාවකදි ස්ථානීය පරීක්ෂණයක් කරමින් තමා සහ පවුලේ අය 2015 වසරේ සිට එකී ස්ථානයේ බදු ගිවිසුම යටතේ පදිංචි වී සිටින බවත්, අවුරුදු 05කට ආසන්න කාලයක් ඡන්දයද එම ස්ථානයේ පාවිච්චි කරන බවත්, නමුත් තමා සහ පවුලේ අය පදිංචිව නොමැති බවට වගඋත්තරකරුවන් කරුණු දක්වා ඇති බවත්ය.

අදාළ පරීක්ෂණය සඳහා වගඋත්තරකාර පාසල වෙනුවෙන් සහභාගි වූ හර්ෂ ප්‍රසන්න යන අය පවසා සිටියේ පෙත්සම්කරුට සම්මුඛ පරීක්ෂණයේදී ලේඛන වලට ලකුණු ලබා දී තිබුණද, ඔවුන්ගේ අයදුම්පත්‍රයේ සඳහන් කර ඇති ලිපිනයේ භෞතිකව පදිංචි වීම තහවුරු නොවීම හේතුවෙන් පෙත්සම්කරුගේ අයදුම්පත්‍රය ප්‍රතික්ෂේප කළ බවයි.

**නිරීක්ෂණය :-**

පෙත්සම්කරු ඔහුගේ දරුවා සහෝදර පදනම මත ගාල්ල රිච්මන්ඩ් විද්‍යාලයට ඇතුළත් කිරීමට අයදුම්පත්‍ර ඉදිරිපත් කර ඇති අතර, සම්මුඛ පරීක්ෂණයේදී ලේඛන පරීක්ෂා කිරීමෙන් අනතුරුව පෙත්සම්කරුට ලකුණු 57.2ක් ලබා දී ඇති අතර, එම ගණය යටතේ සිසුන් ඇතුළත් කරන්නා වූ අවම ලකුණ වන්නේ ලකුණු 47 වේ. වගඋත්තරකාර පාර්ශවය විසින් ස්ථානීය පරීක්ෂණයේදී භෞතික පදිංචිය තහවුරු නොවීම නිසා ඔහුගේ අයදුම්පත්‍රය ප්‍රතික්ෂේප කර ඇති බව සඳහන් කර ඇත. වගඋත්තරකාර පාසල වෙනුවෙන් කරුණු ඉදිරිපත් කරමින් සඳහන් කර ඇත්තේ, ලේඛන වලින් පැමිණිලිකරු අවශ්‍ය ලකුණු ලබා ගෙන ඇතත්, පෙත්සම්කරු පදිංචි වී සිටි බව කියන නිවසේ හිමිකාරයා විසින් ලබා දුන් ප්‍රකාශ අනුව පෙත්සම්කරු එම නිවස බදු පදනම මත හිමිකරුගෙන් ලබා ගෙන ඇතත්, භෞතිකව පදිංචි වී නොමැති බව නිරීක්ෂණය වූ බවයි. ඒ පිළිබඳව නිවැස් හිමිකරු ලිඛිතව ලබා දුන් බවද පවසා ඇත.

තවද, පෙත්සම්කරු විසින් පරීක්ෂණය අතරතුරදී නිවසේ හිමිකරු වන ජයවික්‍රම කංකානම්ගේ දර්ශන තාරක යන අය විසින් ඉදිරිපත් කරන ලද දිවුරුම් ප්‍රකාශයක් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති අතර, එකී දිවුරුම් ප්‍රකාශයේ අදාළ නිවසේ මෙම පෙත්සම්කරු සහ ඔහුගේ පවුලේ අය පදිංචි වී සිටින බවත්, ස්ථානීය පරීක්ෂණය සඳහා පැමිණි පුද්ගලයන් දෙදෙනෙකු නිවැස්හිමිකරුට තර්ජනය කොට බලපෑම් කොට ඔහුගෙන් ලිපියක් ලබාගත් බවත්, ඔහුගේ කැමැත්තකින් තොරව ලියා ගත් ලිපියක් බවත් ප්‍රකාශ කොට ඇත.

තවද පරීක්ෂණය අතරතුරදී පෙත්සම්කරු විසින් ඉදිරිපත් කරන ලද ලේඛනයක් අනුව වගඋත්තරකාර පාසලේ විදුහල්පතිවරයාගේ ඉල්ලීම පරිදි ගාල්ල කඩවත් සතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් පෙත්සම්කරුගේ භෞතික පදිංචිය පිළිබඳව ස්ථානීය පරීක්ෂණයක් සිදුකර තිබූ අතර, එකී වාර්තාව

අනුව මෙම පෙත්සම්කරු සහ ඔහුගේ පවුලේ අය වසර 05ක සිට බදු පදනමින් ඉහත කී නිවසේ පදිංචි වී සිටින බවට පවසා ඇත.

ඉහත කී සියලු කරුණු කාරණා සහ ලිපිලේඛන පිළිබඳව පරීක්ෂා කිරීමේදී පෙත්සම්කරුගේ භෞතික පදිංචිය තවදුරටත් තහවුරු වේ. තවද පෙත්සම්කරු සහ ඔහුගේ කලත්‍රයා රාජ්‍ය සේවයේ යෙදී සිටින නිලධාරීන් බවත්, ස්ථානීය පරීක්ෂණය සිදුකළ අවස්ථාවේදී ඔවුන් නිවසේ නොසිටීම සාධාරණ හේතුවක් බවත් පැහැදිලිය.

තවද මෙම එක් ස්ථානීය පරීක්ෂණයකදී එනම්, 2019.10.11 දින මෙම මව හා පියා යන අය ආයතනයෙන් නිවාඩු ගෙන සිටි බවට තහවුරු කර ඇති අතර, එදින ඔවුන්ගේ මව අසනීපව බැලීමට ගිය නිසා නිවසේ නොසිටි බවට ගෙවල් හිමියා දක්වන කාරණය සනාථ වේ. කෙසේ වුවද ප්‍රායෝගිකව ස්ථාන පරීක්ෂණ කණ්ඩායම ස්ථානීය පරීක්ෂණයක් කිරීමේදී අදාළ නිවැසියන් රැකියාවල නියුතු පුද්ගලයන් බැවින් නිවසේ නොසිටීමේ ඉඩකඩ ඇත. එබැවින් නිවසේ පදිංචිය යන කාරණය වෙනත් කරුණු වලින්ද තහවුරු කළ යුතුව ඇත. නිවසේ නොසිටීම පමණක් මෙහිදී අදාළ කරගත නොහැකි බව කොමිෂන් සභාවේ නිරීක්ෂණයයි.

නිගමනය :-

මෙකී සියළු කරුණු සලකා බැලීමේදී, පැමිණිලිකරුගේ දරුවා වගඋත්තරකාර විද්‍යාලයට ඇතුළත් කර නොගැනීම තුළින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව මගින් සහතික කොට දී ඇති පෙත්සම්කරුගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බවට මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් නිගමනය කරනු ලැබේ.

නිර්දේශය :-

පැමිණිලිකරුගේ දරුවා වන බී. නපනදීෂි යන අය 2021 වර්ෂයේ ගාල්ල රිච්මන්ඩ් විද්‍යාලයේ දෙවන ශ්‍රේණියට ඇතුළත් කරගැනීම සඳහා කටයුතු කළ යුතු බවට මෙයින් නිර්දේශ කරනු ලැබේ.

2021. 05. 03 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

අනුසූයා ෂන්මුගනාදන්,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

**Ms. Anusuya Shanmuganathan**
Commissioner
Human Rights Commissioner of Sri Lanka

මා.හේ. නිමල් කරුණාසිරි,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

**Dr. M.H. Nimal Karunasiri**
Commissioner
Human Rights Commission of Sri Lanka

පිටපත :-

1. ගරු අමාත්‍යතුමා,
   අධ්‍යාපන අමාත්‍යාංශය,
   ඉසුරුපාය, බත්තරමුල්ල.

2. ලේකම්,
   අධ්‍යාපන අමාත්‍යාංශය,
   ඉසුරුපාය, බත්තරමුල්ල.

B/